**ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම - 2025**
**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලෙකෝ ප්‍රොජෙක්ට්ස් සමාගමේ (“සමාගම”) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 09 වන ඡේදයට අනුව, තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්දි අගයෙන් වඩා අඩු වටිනාකමට අගය කල යුතු වුවත්, සමාගම සතු අමුද්‍රව්‍ය සහ නිමි තොග වල ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳ සැලකීමකින් තොරව පිළිවෙලින් රු. 4,827,898 සහ රු.6,729,463 ක් ලෙස, පිරිවැය මත තොග අගය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ අමුද්‍රව්‍ය සහ නිමි තොග සඳහා භෞතික තොග සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ.තොග වෙනස්කම් සඳහා හේතු කළමනාකාරීත්වය විසින් මේ වන විට පරීක්ෂා කරමින් පවතී. කෙසේ වෙතත් භාවිතයකින් තොරව දිගු කාලයක් ගබඩා කර තැබීම හේතුවෙන් මෙම ද්‍රව්‍ය අපතේ ගොස් තිබීමට ඉඩ ඇත. දැනටමත් හානිකරණය සඳහා වෙන් කිරීමක් සමස්ථ තොගය සඳහාම සිදු කර ඇති බැවින් මෙම තොග හිඟය ජංගම වර්ෂයේ ලාභයට හෝ රඳවා ගත් ඉපයීම් වලට කිසිදු බලපෑමක් ඇති නොකරන බව කරුණාවෙන් සලකන්න. | ශ්‍රී ලංකා ගිණුමකරණ ප්‍රමිත අංක 2 ට අනුකූලව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු වටිනාකමට අගය කල යුතු අතර තොග වල නිරවද්‍යතාවය සහ අනුකූලතාවය සහතික කිරීම සඳහා කාලීනව භෞතික තොග සත්‍යාපන කටයුතු සිදු කල යුතුය. |
| (ආ) | ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.1,002,364 ක ආදායම් බදු වියදමක් සහ රු.1,053,665 ක ගෙවිය යුතු ආදායම් බද්දක් හඳුනා ගෙන තිබුණු අතර, 2025 දෙසැම්බර් 31 දින වන විට රු.6,193,396 ක් වූ බදු අලාභයක් ඉදිරියට ගෙන විත් තිබුණි, එසේම සමාලෝචිත වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායම වූ රු.962,823 ක වටිනාකම සම්පූර්ණයෙන්ම හිලව් කිරීමට, උක්ත අලාභය ප්‍රමාණවත් වී තිබුණු බැවින්, | RAMIS සහ පැරණි හිඟ තහවුරු කිරීම් ඇතුළත්ව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සපයා ඇති තෙරෙතුරු වලට අනුව පැහැර හැරීමේ ගාස්තු සහ පොලී මුදල් ඇතුළුව සමස්ථ බදු වගකීම රු.1,053,666.42 ක් වන අතර එම වගකීම සඳහා අදාළ ප්‍රතිපාදනයන් ගිණුම් | බදු වගකීම් නිවැරදිව හඳුනා ගැනීම, මූල්‍ය ප්‍රකාශන සමාලෝචන පටිපාටීන් තවදුරටත් ශක්තිමත් කිරීම සහ බදු වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කිරීම සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලොචිත වර්ෂය සඳහා කිසිදු ආදායම් බදු වගකීමක් හඳුනාගත යුතු නොවීය.<br><br>තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 – (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි) හි විධිවිධාන වලට පටහැනි ලෙස, ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.1,002,364 ක බදු වියදමක් හඳුනාගෙන තිබුණු අතර, මෙම ප්‍රමාණය පෙර කාලපරිච්ඡේදයන්ට අදාළ පැහැර හැරීමේ ගාස්තු සහ පොලියෙන් සමන්විත වන බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් තහවුරු කර තිබුණි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ක්‍රියාවලියේ දුර්වලතා පෙන්නුම් කරන අතර මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාවය පිළිබඳව ගැටලු පෙන්නුම් කෙරිණි. | පොත් තුළ හඳුනාගෙන ඇත. | |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි හි සඳහන් විධිවිධාන වලට පටහැනි ලෙස, පසුගිය මූල්‍ය වර්ෂයට (2024) අදාළ, වටිනාකම රු.115,200 ක් වූ වෘත්තීය ගාස්තු වියදමක්, සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශය සඳහා හඳුනාගෙන තිබුණු අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශණවල සඳහන් වියදම්, එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර ලාභය අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන අතර අනාගත ගණුදෙනු සඳහා අවශ්‍ය පූර්වාරක්ෂිත පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | පෙර කාලපරිච්ඡේද වල සිදු වූ වැරදි අතීතානුයෝගී නැවත ප්‍රකාශ කරමින් ගැලපිය යුතුය. |
| (ඈ) | ඉවතලන ද්‍රව්‍ය මැනීමේ කටයුතු සඳහා 2025 වර්ෂය තුළ ඉන්වොයිස් කර ලබාගත් සේවාවන්ට අදාළ රු.118,515 ක් වියදමක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 37 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණු අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2025 දෙසැම්බර් 31 දිනට අදාළ වගකීම් සහ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. අදාළ ඉන්වොයිසිය 2025 දෙසැම්බර් 16 දිනැති වුවද, එය ආයතනය වෙත ලැබී ඇත්තතේ 2026 පෙබරවාරි මස අගභාගයේදී බව කාරුණිකව දැනුම් දෙමු. එබැවින් අදාළ කාලපරිච්ජයේදී ඊට අදාළ උපචිත සටහන් තැබීමට | එක් එක් වාර්තාකරණ දිනයන්ට අදාළව ඉන්වොයිස් කර නොමැති සියලුම සේවාවන් හඳුනා ගැනීමට සහ නිසි පරිදි ගිණුම්ගත කිරීමට කළමනාකාරීත්වය විසින් කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නොහැකි විය. තවද, විශ්වාසදායක තොරතුරු නොතිබීම හේතුවෙන් එම පිරිවැය නිවැරදිව තක්සේරු කිරීමටද හැකියාවක් නොතිබුණි. | |
| (ඉ) | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් ලංකා විදුලි පුද්ගලික සමාගමෙහි හා ඇන්ටි ලොකෝ මීටරින් සමාගමේ ගබඩාවලට මාරු කර තිබුණ ද, රු.5,159,044 වූ උක්ත වත්කම්වල පිරිවැය සහ සමුච්චිත ක්ෂය අගය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ.දිගු කාලීන භාවිතය හේතුවෙන් හානියට පත් වූ මෙම වත්කම් ඉවත් කර දැමීමේ කටයුතු සඳහා වස්කඩුව ගබඩාව වෙත මාරු කරන ලදි. ලංකා විදුලි පුද්ගලික සමාගම වෙත කිසිදු වත්කමක් මාරු කර නොමැත.<br><br>තවද, මෙම වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති බැවින් මෙමඟින් සමාගමේ මූල්‍ය තත්ත්වයන්ට කිසිදු බලපෑමක් සිදු නොවේ. | භාවිතයෙන් ඉවත් කරන ලද වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයෙන් කාලානුරූපීව ඉවත් කිරීමට සහ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කළමනාකාරීත්වය විසින් කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණු මුදල් සහ මුදලට සමාන දෑ වල ශේෂය රු.19,686,766 ක් වූ අතර, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වාර්තා කර තිබුණු ඊට අනුරූපී ශේෂය රු.19,543,736 ක් විය. එහි ප්‍රතිපළයක් වශයෙන්, එම ප්‍රකාශ අතර රු.143,030 ක නොසැසඳුණු වෙනසක් පැවතුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. ලද පොලී ආදායම සහ ස්ථාවර තැම්පතු ආයෝජනයන්හි සිදු වූ වෙනස්වීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ නිසි පරිදි හඳුනාගෙන නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පෙර මුදල් ශේෂයන් නිසි පරිදි සංසන්දනය කිරීම සහ එහිදී මතුවන ඕනෑම වෙනස්කමක් හඳුනා ගැනීමට සහ නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සම්බන්ධිත පාර්ශව ශේෂයන් අතර නොසැසඳු වෙනස රු.1,884,984 ක් වූ අතර, මේ අතර, ලංකා විදුලිබල මණ්ඩලයෙන් සමාගමට ලැබිය යුතු ශේෂය සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් වාර්තා කර තිබුණු, ඊට අනුරූප ගෙවිය යුතු ශේෂය අතර රු.1,530,624 ක වෙනසක්ද, ලංකා විදුලි පුද්ගලික | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. 2026 මූල්‍ය වර්ෂය තුළදී ඊට අදාළ ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | සම්බන්ධිත පාර්ශව ශේෂයන් නිසි පරිදි සංසන්දනය කල යුතුය. මූල්‍ය වාර්තාකරණයේ නිවැරදිභාවය තහවුරු කිරීම සඳහා ශේෂ සනාථන කිරීම් ලබා ගැනීම සහ අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | සමාගමෙන් ලැබිය යුතු ශේෂය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් වාර්තා කර ඇති ඊට අනුරූප ගෙවිය යුතු ශේෂය අතර රු.354,360 ක වෙනසක්ද ඇතුළත් විය. | | ගැලපීම් සිදු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් අදායම් බදු මුදල විගණනයේ ගණනය කිරීම් වලට අනුව රු.161,984 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන රු.145,271 ක් පමණක් තුළ හඳුනාගෙන තිබුණි. ඒ අනුව අත්තිකාරම් ආදායම් බද්ද රු.16,713 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ජංගම වත්කම් සහ වර්ෂයේ පොලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි AIT වටිනාකම රු.159,438 ක් වන අතර ඒ අනුව අඩුවෙන් දක්වා ඇති මුදල රු.16,407 ක් වන බව කාරුණිකව දැනුම් දෙමු. මෙම අඩුවෙන් දැක්වීම වර්තමාන මූල්‍ය වර්ෂයේදී ගැලපීමට කටයුතු කරනු ලැබේ. | අත්තිකාරම් ආදායම් බදු වාර්තාවන් සැසඳීම, නිවැරදි බදු සහනය හඳුනා ගැනීම සහ නිවැරදි මූල්‍ය වාර්තාකරණයක් තහවුරු කිරීමට පාලන සමාලෝචන ක්‍රියාවලිය ශක්තිමත් කල යුතුය. |

### 1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 මූල්‍ය වර්ෂයේ සිට විදුලිය බෙදාහැරීම සඳහා යටිතල පහසුකම් සැපයීමේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු සමාගම විසින් නතර කළ බව විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් 2.1 සටහන වෙත අවධානය යොමු කරවීමට කැමැත්තෙමි. එහි දක්වා ඇති පරිදි, සමාගම 2025 දෙසැම්බර් 31 වන විට රු. 19,021,671 ක සමුච්චිත අලාභයක් ලබා ඇති අතර එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු.39,542 ක බදු පෙර අලාභයක් වාර්තා කර ඇත. 2025 දෙසැම්බර් 31 දිනට සමාගමේ වාසිදායක ශුද්ධ වත්කම් ප්‍රමාණය රු.5,979,329 ක් වූ අතර එය ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකට වඩා අඩුවෙන් පැවැතුණි. ඒ අනුව, 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වැනි වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති පරිදි තදබල ප්‍රාග්ධන පාඩුවක් පෙන්නුම් කරන අතර, සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් අත්හිටුවීමත් සමඟ සමාගමට අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පෙන්නුම් කර තිබුණු. කෙසේ වෙතත්, එම සටහනෙහි හෙළිදරව් කර ඇති පරිදි, | කළමනාකරණය විසින් පිළිතුරු ලබා දී නොතිබුණි. | සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ඇගයීමට ලක් කල යුතු අතර සමාගම් පනතට අනුකූල වීම තහවුරු කිරීම, තිරසාර ව්‍යාපාරික පුනර්ජීවන සැලසුමක් ක්‍රියාත්මක කිරීම සහ මූල්‍ය තිරසරභාවය තහවුරු කර ගැනීම සඳහා මව් සමාගමෙන් ලේඛනගත කල දිගු කාලීන මූල්‍ය සහයක් ලබා ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කල යුතුය. |

සමාගමට එහි මව් සමාගම වන ලංකා විදුලි පුද්ගලික සමාගම වෙතින් අඛණ්ඩව මූල්‍ය පහසුකම් ලැබීම මත සමාගමට අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකියාව ලැබී තිබුණි.

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය ප්‍රකාශන වල දැක්වුනු රු.9,458,986 ක් වූ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂයන් දිගු කාලයක් තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ඒ සඳහා සම්පූර්ණ හානිකරණයක් සිදු කර තිබුණි. ණයගැතියන් පිළිබඳ විස්තරාත්මක වාර්තා, වයස් විශ්ලේෂණයන් සහ සහයක ලේඛන නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් එම හිඟ ශේෂයන් කාර්යක්ෂම ලෙස අධීක්ෂණය කිරීමට සහ අයකර ගැනීමට තිබූ හැකියාව සීමා වී තිබුණු අතර, වාර්තාකරණ දිනය වන විටත්, කිසිදු මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. අවශ්‍ය තොරතුරු සහ ලේඛනයන් නිසි පරිදි පවත්වාගෙන යාම තහවුරු කිරීමටත්, නොපියවා පවතින සියලුම හිඟ ශේෂයන් අය කර ගැනීමටත් අවශ්‍ය සියලු ඉදිරි පියවර ගනු ලැබේ. | ලැබිය යුතු හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වන වගන්තිය | සමාගමේ ශුද්ධ වත්කම් ප්‍රමාණය එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සියයට 50 කට වඩා අඩු මට්ටමකට පහත වැටී තිබුණද, මෙම වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණය විසින් පිළිතුරු ලබා දී නොතිබුණි. | සමාගම් පනත යටතේ අවශ්‍ය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වහාම අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා, සමාගමේ මූල්‍ය තත්ත්වය තක්සේරු කර, ප්‍රාග්ධන ප්‍රතිව්‍යුහගත කිරීම හෝ අවසන් කිරීම වැනි සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.39,542 ක අලාභයක් වූ අතර එයට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.1,516,232 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,555,774 ක අඩු වීමක් නිරීක්ෂණය විය. සමාලොචිත වර්ෂයේ ආදායම් බදු රු.1,002,364 ක් අය කිරීම මෙම අඩුවීමට ප්‍රධානම හේතුව ලෙස දැක්විය හැකිය.

**2.2 අනුපාත විශ්ලේෂණය**

(අ) සමාගමේ ජංගම වත්කම් අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 1.28 සිට 1.26 දක්වා අඩු වී තිබුණි.

(ආ) ස්කන්ධ මත ප්‍රතිලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 25.2 සිට සියයට (0.66) දක්වා අඩු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ (ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම) කොටස් ප්‍රාග්ධනය සඳහා, ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) විසින් රු.මිලියන 25 ක් ආයෝජනය කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ කළමනාකාරීත්වය විසින්, සුදුසු ව්‍යාපාරික උපායමාර්ගයක් අනුගමනය කිරීමට අසමත් වී තිබුණු අතර, ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වැනි ආයතන සඳහා කොන්ක්‍රීට් කණු සපයමින්, ඒ වන විටත් ක්ෂේත්‍රයේ රැඳී සිටි, තරඟකරුවන්, නිෂ්පාදකයින් ලෙස යොදා ගණිමින්, ඒකක පදනම මත නිෂ්පාදන කටයුතු සිදු කිරීමට තීරණය කිරීම කර තිබුණු අතර, තරඟකාරී වෙළඳපොළ පරිසරය හෝ සැපයුම්කරුවන්ගේ බැඳියා ගැටුම පිළිබඳව නිසි ඇගයීමක් සිදු කිරීමට කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සැපයුම්කරුවන් විසින් තාක්ෂණික වශයෙන් දෝෂ සහිත කොන්ක්‍රීට් කණු නිෂ්පාදනය කර සපයා තිබුණු අතර, පසුව ලංකා විදුලිබල මණ්ඩලය සහ ටෙලිකොම් ආයතනය වැනි ගැණුම්කරුවන් විසින් සමාගමින් කණු මිළදී ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. මෙම උපායමාර්ගික අසාර්ථකත්වය හේතුවෙන් ව්‍යාපාරය වානිජමය වශයෙන් පවත්වාගෙන යා නොහැකි තත්වයට පත් වී තිබුණු අතර, | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. කළමනාකාරීත්වය විසින් දැනට පවතින ව්‍යාපාරික මෙහෙයුම් පිළිබඳව සමාලෝචනය කරමින් පවතින අතර ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යන්නේද, නැතහොත් මෙහෙයුම් අත්හිටුවා සමාගම ඈවර කිරීමේ ක්‍රියාවලියට යොමු වන්නේද යන්න පිළිබඳව තීරණය කරනු ලැබේ. | ව්‍යාපෘතියේ උපායමාර්ගික තීරණ සමාලෝචනය කිරීමට, ව්‍යාපෘති යහපාලනය ශක්තිමත් කිරීමට සහ එවැනි ආයෝජන අසාර්ථකවීම් නැවත සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |

සමාගම විසින් සිදු කර තිබුණු රු.මිලියන 25 ක සම්පූර්ණ ආයෝජනය අහිමිවී තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |